# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2294/27 - 2022 අගෝස්තු මස 22 වැනි සඳුදා - 2022.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කන්තලේ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

සභාවේ අවසරය කලින් ඉල්ලුම් කර ලබා නොගෙන, මාස තුනක කාල සීමාවක් සභාවේ රැස්වීම්වලට සහභාගී නොවීම හේතුකොට ගෙන කන්තලේ ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කන්තලේ ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ මොහොම්මදු ෆාරුක් රාහුමානි අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම කන්තලේ ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා බස්නායක මුදියන්සේලාගේ ෂිරානි කුසුම් කුමාරි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කන්තලේ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, පියුමි ආටිගල වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, බස්නායක මුදියන්සේලාගේ ෂිරානි කුසුම් කුමාරි, කන්තලේ ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**පියුමි ආටිගල,**
තේරීම්භාර නිලධාරි,
කන්තලේ ප්‍රාදේශීය සභාව.

2022 අගෝස්තු මස 19 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ත්‍රිකුණාමලය.

EOG 08 - 0221

1A - G 37320 — 16 (2022/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ උඩුනුවර ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන උඩුනුවර ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ උඩුනුවර ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ රාජපක්ෂ මුදියන්සේලාගේ බන්දුල කුමාර සෙනෙවිරත්න අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම උඩුනුවර ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සෙනෙවිරත්න මුදියන්සේලාගේ ඉන්දික වරුණ බංඩාර සෙනෙවිරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

උඩුනුවර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, හේවාගේ ධනුෂ්ක නලින් සම්පත් ප්‍රනාන්දු වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් සෙනෙවිරත්න මුදියන්සේලාගේ ඉන්දික වරුණ බංඩාර සෙනෙවිරත්න, උඩුනුවර ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

ආචාර්ය **එච්.ඩී.එන්.සම්පත් ප්‍රනාන්දු,**
තේරීම්භාර නිලධාරි,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2022 අගෝස්තු මස 19 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

EOG 08 - 0222

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.